උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

දිවි තොර කර ගැනීමක් හා දිවි තොර කර ගැනීම සම්බන්ධ සිදුවීමක් වාර්තා කිරීමේ දී, හදිසි උපකාරක අංක පළ කරන ලෙස Ethics Eye අපි මාධ්‍ය දිරිමත් කරමු.

එයට හේතුව වන්නේ, උපකාරක අංක සමගින් දිවි තොර කර ගැනීම් වැනි සිදුවීම් වාර්තා කිරීමෙන්, දිවි තොර කර ගැනීමට නැඹුරුවක් ඇති අයෙකු උපදේශනය වෙත යොමුවීමට ඒ ඔස්සේ හැකියාවක් ලැබීමත්, එය ජීවිතයක් බේරා ගැනීමට හේතුවක් විය හැකි වීමත් වේ.

දිවි තොර කර ගැනීම වාර්තා කිරීමේදී හදිසි උපකාරක අංක සඳහන් කිරීම යෝග්‍ය බව, ලෝක සෞඛ්‍ය සංවිධානය, සමාරිටන්ස් වැනි ආයතන ඔස්සේ පළකර ඇති මාධ්‍ය මාර්ගෝපදේශයන් තුළ ද පෙන්වා දෙනු ලැබේ.

එප්පාවල ප්‍රදේශයේ එකම පවුලක පස් දෙනෙකු කාලයක් පුරාවට දිවි තොර කර ගෙන ඇති බවට වන පුවත් වාර්තාව සියත පුවත් විකාශය ඔස්සේ පළ වී තිබිණි.

එහිදී එම පුවතට අමතරව විශේෂඥ මනෝ වෛද්‍යවරයෙකුගේ අදහස් ද, එසේම දිවි තොර කර ගැනීමට නැඹුරුතාවයක් දක්වන අයකුට සම්බන්ධ විය හැකි හදිසි උපකාර අංක ද පළ කරන්නට සියත පුවත් ප්‍රවේසම් සහගත වී තිබිණි.

එය සැබැවින්ම ප්‍රශංසා කටයුතු වාර්තාකරණයක් ලෙස පෙන්වා දිය හැක.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!